# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 ජූලි මස 04 වන දින

## II වන කොටස

## අතිරේකය

(2025.07.08 දින නිකුත් කරන ලදී)


# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. **43.50** තැපැල් ගාස්තුව : රු. **150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 82 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, 4 වන වගන්තියෙන් සිදු කිරීමට යෝජිත සංශෝධනය සාමාන්‍ය ව්‍යතිරේකවල විෂය පථයෙන් බැහැර කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් "ඕනෑකමින්ම" යන වචනය වෙනුවට "චේතනාන්විතව ම" යන වචනය ආදේශ කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වන වගන්තිය සංශෝධනය කරනු ලබයි.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 308ආ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ළමයින් සම්බන්ධයෙන් කෲර සහ අවමන් සහගත, ශාරීරික, හෝ ශාරීරික නොවන දඬුවම් පැනවීම තහනම් කිරීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 314අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ළමයකුට එරෙහිව ස්වේච්ඡාවෙන්ම තුවාල කිරීමේ වරද සිදුකරන අවස්ථාවක දී ඉහළ දණ්ඩනයක් හඳුන්වාදීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 316අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ළමයකුට එරෙහිව ස්වේච්ඡාවෙන්ම බරපතල තුවාල කිරීමේ වරද සිදුකරන අවස්ථාවක දී ඉහළ දණ්ඩනයක් හඳුන්වාදීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.-ඕ 41/2024

## (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක            දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

19 වන අධිකාරයේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 82 වන වගන්තියේ නිදර්ශනයට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"පස්වනු ව - ළමයින් සම්බන්ධයෙන් ශාරීරික දඬුවම් පැනවීම කෙරෙහි මේ ව්‍යතිරේකය ව්‍යාප්ත නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ඕනෑකමින්ම" යන වචනය වෙනුවට "චේතනාන්විතවම" යන වචනය ආදේශ කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 308ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 308ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"ළමයින් සම්බන්ධයෙන් ශාරීරිකව දඬුවම් කිරීම

**308ආ.** (1) වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂකත්වය දරා සිටිමින්-

(අ) දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන්, කෙතරම් අඩු වුවද යම් ප්‍රමාණයක

වේදනාවක් හෝ අපහසුතාවක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික බලය භාවිත කරනු ලබන යම් ක්‍රියාවක් සිදුකරන; හෝ

(ආ) කෙතරම් අඩු වුව ද යම් ප්‍රමාණයක අවමානයක් ඇතිවීමට හේතුවන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදුකරන,

කවර හෝ තැනැත්තකු ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකරන්නේ ය.

(2) ළමයින් සම්බන්ධයෙන් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකරන කවර හෝ තැනැත්තකුට වරදකරු කරනු ලැබීමේ දී මාස හයක් නොඉක්මවන්නා වූ කාලයකට බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් ලක්ෂයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි දඩයකින් හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය හෝ යන දෙකින්ම දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය විසින් ගොනු කරනු ලබන වින්දිත බලපෑමේ ප්‍රකාශය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද ආඥා කරනු ලැබිය හැකි ය.

(3) (අ) රජයේ අධිකාරි ආයතනයක හෝ පුහුණු පාසලක, පාසල් නේවාසිකාගාරයක, ළමා නිවාසයක හෝ දිවා සුරැකුම්

මධ්‍යස්ථානයක භාරයේ සිටින වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකු සම්බන්ධයෙන්; හෝ

(ආ) ශාරීරික වශයෙන් හෝ මානසික වශයෙන් අශක්නුතාවක් සහිත වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකු සම්බන්ධයෙන්,

ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකරන කවර හෝ තැනැත්තකුට වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට නොඅඩු වූ ද අවුරුදු දෙකක් නොඉක්මවන්නාවූ ද කාලයකට බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් ලක්ෂයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකින්ම දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය විසින් ගොනු කරනු ලබන වින්දිත බලපෑමේ ප්‍රකාශය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද නියෝග කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, වරදකරන ලද තැනැත්තා වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තකු වන අවස්ථාවක දී, අධිකරණය විසින් මාස හයකට වඩා අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් නියම කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා ''රජයේ අධිකාරි ආයතනයක භාරය යටතේ'' යන්නෙන්

යම් ලිඛිත නීතියක අර්ථානුකූලව වන භාරයක් අදහස් වේ.

**නිදර්ශන**

(අ) ''බී'' ගේ ළමයා වන ''ඒ'' විසින් විභාගයක් සඳහා අධ්‍යයන කටයුතු කරන ලෙස ''බී'' විසින් ලබාදෙන නියෝග අනුගමනය කිරීම ප්‍රතික්ෂේප කරයි. ''බී'' විසින් දඬුවමක් වශයෙන් ''ඒ'' ට බඳ පටියකින් පහර දෙයි. මෙම පහරදීම හේතුවෙන් ''ඒ'' ට ශාරීරික තුවාල සිදුවේ. ''බී'' විසින් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකර ඇත.

(ආ) ළමා නිවාසයක රැක බලා ගන්නකු වන ''ඒ'' විසින් එම ආයතනයේ ළමයකු වන ''බී'' තවත් ළමයකුට හිරිහැර කිරීමක් නිරීක්ෂණය කරයි. දඬුවමක් වශයෙන් ''ඒ'' විසින් පැය ගණනක් තිස්සේ ''බී'' වෙත ආහාර ලබා නොදී සිටියි. ''ඒ'' විසින් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකර ඇත.

(ඇ) ගුරුවරයකු හෝ විදුහල්පතිවරයකු වන ''ඒ'' විසින් ''බී'' නමැති ළමයකු තවත් ළමයකුගේ දෙයක් සොරකම් කර ඇති ලෙස විශ්වාස කර ''බී'' පාසල් රැස්වීම් වේදිකාවට කැඳවා පාසල් ශිෂ්‍ය සමූහය ඉදිරිපිට දී ''බී'' සොරකු ලෙස ප්‍රකාශ කරමින් ''බී'' ට අවමන් කරයි. ''ඒ'' විසින් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකර ඇත.

(ඈ) විදුහල්පතිවරයා විසින්, අවුරුදු 16ක් වයසැති පාසල් ශිෂ්‍ය නායකයා වන ''ඒ'' ව සිසුන්ගේ නිළ ඇඳුම අධීක්ෂණය කිරීම සඳහා යොදවනු ලබයි. ''ඒ'' විසින් ''බී'' නමැති සිසුවා පාසල් නිළ ඇඳුම උල්ලංඝනය කරමින් ඇඳුම් ඇඳ සිටින බවට අනාවරණය කර ගනියි. ''ඒ'' විසින් ''බී'' ට අතුල් පහරක් දෙන නමුත් ''බී'' ට කිසිදු ශාරීරික තුවාලයක් සිදු නොවේ. ''ඒ'' විසින් ශාරීරික දඬුවම් ලබාදීමේ වරද සිදුකර ඇත.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 314 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 314අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට 314අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

“ළමයින්ට ස්වේච්ඡාවෙන්ම තුවාල සිදුකිරීමට දඬුවම

**314අ.** 325 වන වගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවේදී හැර, වයස අවුරුදු දහඅටකට වඩා අඩු තැනැත්තකුට ස්වේච්ඡාවෙන් තුවාල සිදුකරන කවර හෝ තැනැත්තකුට අවුරුදු දෙකක කාලයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පන්දහසක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම වරද සිදුකරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය විසින් ගොනු කරනු ලබන වින්දිත බලපෑමේ ප්‍රකාශය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද ආඥා කරනු ලැබිය හැකි ය.”.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 316 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 316අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට 316අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

“ළමයින්ට ස්වේච්ඡාවෙන්ම බරපතළ තුවාල සිදුකිරීමට දඬුවම

**316අ.** 326 වන වගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවේ දී හැර, වයස අවුරුදු දහඅටකට වඩා අඩු තැනැත්තකුට ස්වේච්ඡාවෙන් බරපතළ තුවාල සිදුකරන කවර හෝ තැනැත්තකුට අවුරුදු දහයක කාලයක් සඳහා දීර්ඝ කරනු

ලැබිය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම වරද සිදුකරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය විසින් ගොනු කරනු ලබන වින්දිත බලපෑමේ ප්‍රකාශය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙසද ආඥා කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය, එම වගන්තියේ නිදර්ශනයේ (එ) ඡේදය ඉවත්කිරීම මගින් මෙයින් සංශෝධනය, කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**8.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.